**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I,- 2015**

**-----------------------------------------------------------------**

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර I, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල් - පී110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සටහනේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**---------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂණ තත්ත්වයන් හා සෞඛ්‍ය තත්ත්වයන් වර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වූ අතර රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2018 පෙබරවාරි වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

2015 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 6.61 ක් වූ එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට ශ්‍රී ලංකා රජයේ දායකයට එරෙහිව හිලව් කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 5,166 | 8,726 | - | 91.24 | 101.52 | 293.42 | 347.52 |
| ශ්‍රී ලං ර | 1,651 | 2,789 | - | 39.97 | 44.37 | 106.64 | 125.44 |
| එකතුව | 6,817 | 11,515 | - | 131.21 | 145.89 | 400.06 | 472.96 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ අරමුදල් වෙන්කර නොතිබුණද ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 145.89 ක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණි.

(ආ) ව්‍යාපෘති ලියවිල්ලේ වියදම් උපලේඛනයේ 42 ඡේදය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දක්වා ජපන් යෙන් මිලියන 791 ක් මුදා හැරීමට එකඟ වී තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් උපයෝජනය කරන ලද තථ්‍ය අරමුදල් වෙන් කරන ලද මුදලින් සියයට 37.09 ක් නියෝජනය වන රු.මිලියන 347.52 කට සමාන ජපන් යෙන් මිලියන 293.42 ක් විය. තවද උපයෝජනය නොකරන ලද වෙන්කිරීම් මත 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 13.28 ක් වූ බැඳීම් ගාස්තු ණය නියෝජිතායතනය විසින් අයකර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

-------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 21.59 ක් හා සියයට 4.42 ක් විය. නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ පාර්ශවයන් වෙනුවෙන් මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් භෞතික හා මූල්‍ය ඉලක්ක සහිතව වගකීම් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද දිනයේ සිට වර්ෂ 03 ක් ඉකුත් වීමෙන් පසුවද පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජල තුළුමුව, ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරය, උස් ජල ටැංකි හා සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නළ මාර්ග එළිම ආදිය 2016 ජුලි 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ලියවිල්ලේ ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයේ 2.2 ඡේදය අනුව, ව්‍යාපෘතියේ උපදේශක සේවා සඳහා සුදුසු සේවා සපයන්නකු ප්‍රසම්පාදනය කිරීම 2013 සැප්තැම්බර් මාසයට පෙර නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත්තු, මාස 09 ක ප්‍රමාදයක් සහිතව 2014 ජුනි 13 දින පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් පිරිනැමීම සඳහා අපේක්ෂිත සියලුම කොන්ත්‍රාත්තු සඳහා විස්තරාත්මක සැලසුම් සහ කෙටුම්පත් ලංසු ලියකියවිලි පිළියෙල කිරීම, සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව ආරම්භ කර තිබුණි.

(ආ) මහකනදරාව රක්ෂිතය, සඳහා යෝජිත ඉඩම සඳහා අනුමැතිය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ලබාදී නොතිබූ බැවින්, තුළුමුව පහසුකම්, ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරය, ජලය ගබඩා කිරීම හා විධායක නිල නිවාස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු 2016 ජුලි 31 වන විටත් පිරිනමා නොතිබුණි. කෙසේ වුවද රජයේ තක්සේරුකරු විසින් අත්පත් කරගත් ඉඩම සඳහා කරන ලද රු.977,500 ක තක්සේරුව සැලකීමෙන් තොරව ඒ සඳහා රු.මිලියන 2 ක මුදලක් ප්‍රදේශයේ නිවැසියකුට ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාපෘති ලියවිල්ලේ ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය අනුව, "ඉහළ ඝනත්ව පොලි එතිලින් සම්ප්‍රේෂණ" (High Density Poly Ethylene Transmission) නළ සැපයීම හා එළිම, උප නළය (Sub Main) සහ බෙදාහැරීම් නලය 2015 ජුනි 30 දින ආරම්භ කිරීම සඳහා මුලදී සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, අදාළ කොන්ත්‍රාත්තු 2016 ජුලි 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි. තවද ඉසින්බෙස්සගල, ඇතාකඩ හා රඹෑව බෙදාහැරීම් කලාපවල බෙදාහැරීම් පද්ධති සැපයීම හා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තු 2015 මැයි 31 ට පෙර පිරිනැමීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්තු පිරිනැමීමට ව්‍යාපෘතිය විසින් 2016 ජුලි 31 වන විටත් කටයුතු කර නොතිබුණි.